ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව
இலங்கை காப்புறுதி ஒழுங்குமுறைப்படுத்தல் ஆணைக்குழு
INSURANCE REGULATORY COMMISSION OF SRI LANKA

INSURANCE REGULATORY COMMISSION OF SRI LANKA

11 වන මහල, නැගෙනහිර කුළුණ
ලෝක වෙළඳ මධ්‍යස්ථානය
කොළඹ 01, ශ්‍රී ලංකාව.

11ம் மாடி, கிழக்கு கோபுரம்
உலக வர்த்தக மையம்
கொழும்பு 01, இலங்கை.

Level 11, East Tower
World Trade Centre
Colombo 01, Sri Lanka.

+94 11 2396184-9
+94 11 2396190
www.ircsl.gov.lk

# ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව

## මෝටර් වාහන අනතුරු මගින් තුන්වන පාර්ශවීය වින්දිතයන්ට සිදුවන මරණ හෝ ස්ථිර අබලතා සඳහා වන්දි ලබාගත හැකි විකල්ප ක්‍රමවේදය

2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත යටතේ ලියාපදිංචි සාමාන්‍ය රක්ෂණ ආයතන වෙත නිකුත් කරනු ලබන චක්‍රලේඛය

දිනය: 2024.02.26 2024 අංක 03

### හැඳින්වීම

1. මෙම ක්‍රමවේදය, මෝටර් වාහන අනතුරු වලට මුහුණ දෙන පහත 3 ඡේදයේ සඳහන් තුන්වන පාර්ශවීය වින්දිතයන්ට හෝ පහත 4 ඡේදයේ සඳහන් ඔවුන්ගේ නීත්‍යානුකූල උරුමකරුවන්ට, අධිකරණ ක්‍රියාදාමයන්ගෙන් පරිබාහිරව වන්දි ලබාගත හැකි විකල්ප ක්‍රමයකි.

   මෙම ක්‍රමවේදය ක්‍රියාත්මක වීම තුළින් දැනට පවතින නීති පද්ධතිය යටතේ වන්දි ලබාගැනීමට ඇති අයිතීන්ට කිසිදු බාධාවක් සිදු නොවේ.

2. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි ලියාපදිංචි සාමාන්‍ය රක්ෂණ ආයතන විසින් මෝටර් වාහන අනතුර සම්බන්ධයෙන් කිසිම නීත්‍යානුකූල වගකීමක් ආරෝපණය කරගැනීමකින් තොරව සානුකම්පිත (Ex-gratia) පදනම මත මෙම වන්දි ගෙවීම සිදු කරයි. ලියාපදිංචි සාමාන්‍ය රක්ෂණ ආයතන "ඇමුණුම 01" හි දක්වා ඇත.

   තවද, මෝටර් වාහන අනතුර සිදුකළ වාහනයට අදාල රක්ෂණ ඔප්පුවේ වගන්තියක් හෝ කොන්දේසියක් උල්ලංඝනය වීම හෝ කඩ වීම, මෙම ක්‍රමය යටතේ වන්දි ලබාගැනීමට බාධාවක් නොවේ.

### මෙම ක්‍රමවේදය යටතේ තුන්වන පාර්ශවීය වින්දිතයන් යන්නෙන් අදහස් කරන පුද්ගලයන්

3. පහත (5), (6) සහ (7) ඡේද යටතේ සඳහන් පුද්ගලයන් නොවන, මෝටර් වාහන අනතුරු වලට මුහුණ පා මරණයට පත්වන හෝ මෙහි "ඇමුණුම 02 (අ)" ප්‍රකාරව ස්ථිර අබලතා තත්වයකට භාජනය වන පුද්ගලයින්.

### වන්දි ගෙවීම් සිදු කරන ආකාරය

4. වින්දිතයාට හෝ ඔහුගේ හෝ ඇයගේ නීත්‍යානුකූල උරුමකරුවන්ට පහත ආකාරයට වන්දි ගෙවීම සිදු කරනු ලැබේ:

   අ) වින්දිතයා මරණයට පත් වූ අවස්ථාවක (වින්දිතයා වයස අවුරුදු 18ට වැඩි පුද්ගලයකු විය යුතුය);

(1) වින්දිතයා විවාහක නම්, ඔහුගේ/ ඇයගේ කලත්‍රයාට සහ බාලවයස්කාර දරුවන්ට;
හෝ

(2) වින්දිතයා අවිවාහක නම්, ඔහුගේ/ ඇයගේ දෙමාපියන්ට.

ආ) වින්දිතයා මෙහි "ඇමුණුම 02 (අ)" හි සඳහන් ස්ථිර, පූර්ණ/ අසම්පූර්ණ අබලතා තත්වයට පත්ව ඇති අවස්ථාවකදී, වින්දිතයාට වන්දි ගෙවීම සිදු කරයි. වින්දිතයාට වන්දි මුදල ගෙවීම ප්‍රායෝගිකව සිදුකළ නොහැකි අවස්ථාවකදී වින්දිතයා වෙනුවෙන් පහත සඳහන් පුද්ගලයන්ට වන්දි ගෙවීම සිදු කරයි:

(1)වින්දිතයා බාලවයස්කරුවෙකු හෝ අවිවාහක නම්, ඔහුගේ/ ඇයගේ දෙමාපියන්ට;
හෝ

(2)වින්දිතයා විවාහක නම්, ඔහුගේ/ ඇයගේ කලත්‍රයාට හෝ කලත්‍රයා මියගොස් ඇත්නම් දරුවන්ට.

## මෙම ක්‍රමවේදය අදාල නොවන පාර්ශවයන්

5. මෝටර් වාහනයකට සිදුවන අනතුරක් හේතුවෙන් මරණයට හෝ ස්ථිර අබලතා තත්වයකට භාජනය වන එම මෝටර් වාහනයේ රියදුරු, සේවකයින් සහ ගමන් කරන මගීන්.

6. වන්දි ලබාගැනීමේ අරමුණින් හෝ ඕනෑකමින් වාහන වල ගැටීමට ලක්ව මරණයට පත්වන හෝ ස්ථිර අබලතා තත්වයකට භාජනය වන පුද්ගලයන්.

7. ත්‍රස්තවාදී ක්‍රියාවලට සහ කැරලි, කෝලාහල වලට සම්බන්ධ වන මෝටර් වාහන වලින් සිදුකරන අනතුරු වලින් මරණයට පත්වන හෝ ස්ථිර අබලතා තත්වයකට භාජනය වන පුද්ගලයන්.

## වන්දි ප්‍රමාණය

8. මෙම වන්දි ක්‍රමය යටතේ යම් එක් අනතුරක් සඳහා එක් වින්දිතයෙකුට අදාලව පහත සඳහන් පරිදි වන්දි ගෙවීම සිදු කෙරේ:

අ) මරණයකදී, රුපියල් ලක්ෂ පහක් (රු, 500,000/-) ද

ආ) මෙහි "ඇමුණුම 02 (අ)" ප්‍රකාරව, ස්ථිර, පූර්ණ/ අසම්පූර්ණ අබලතා තත්වයකදී, රුපියල් ලක්ෂ පහක (රු.500,000/-) උපරිමයකට යටත්ව, එහි සඳහන් සීමාවන්ට අනුකූලව ද

වන්දි ගෙවීම සිදුකරනු ලැබේ.

## වන්දි ගෙවීමට අදාල නියමයන් හා කොන්දේසි

9.

අ) අදාල අනතුර සිදුකළ මෝටර් වාහනයට අවම වශයෙන් ඇමුණුම 01හි සඳහන් රක්ෂණ ආයතනයක් විසින් නිකුත් කරන ලද තුන්වන පාර්ශවීය මෝටර් රක්ෂණයක් තිබීම අනිවාර්ය වේ.

ආ) මරණය හෝ ස්ථිර, පූර්ණ/ අසම්පූර්ණ අබලතා තත්වයට පත්වීම අදාල මෝටර් වාහන අනතුරේ ප්‍රතිඵලයක් නිසා සිදු විය යුතුය.

ඇ) අනතුර සිදු වී මාස 12ක් ඇතුළත, මරණය හෝ ස්ථිර, පූර්ණ/ අසම්පූර්ණ අබලතා තත්වයට පත්වීම හෝ පත්වීම ආරම්භ වීම සිදුවිය යුතුය.

ඈ) මරණය හෝ ස්ථිර, පූර්ණ/ අසම්පූර්ණ අබලතා තත්වයට පත්වීමෙන් මාස 6ක් ඇතුළත අදාල රක්ෂණ ආයතනයෙන් වන්දි ඉල්ලීම සිදුකළ යුතු වේ.

## වන්දි අයදුම් කිරීම

10. මෙම ක්‍රමවේදය යටතේ වන්දි අයදුම් කළයුතු ආකාරය දැක්වෙන උපදෙස් අඩංගු අයදුම් පත්‍රය "ඇමුණුම 02" හි ඇතුලත් කර ඇත.

## නැවත අධිකරණයකට යෑමේ අයිතිය

11. මෙම විකල්ප වන්දි ක්‍රමය යටතේ වන්දි ලබාගත් වින්දිතයෙකුට හෝ ඔහුගේ/ ඇයගේ නීත්‍යානුකූල උරුමකරුවෙකුට, සිදු වූ හානියට සාපේක්ෂව ලබාගත් වන්දි මුදල ප්‍රමාණවත් නොවන බව හැඟී යන අවස්ථාවක, නිසි වන්දි මුදලක් ලබාගැනීම සඳහා අධිකරණය හරහා එම අනතුරටම අදාලව නඩුකරයක් ගොනු කිරීමේ හැකියාව ඇත.
12. එවන් නඩුකරයකදී වින්දිතයාට පක්ෂපාති අධිකරණ නඩු තීන්දුවක් දුන් අවස්ථාවක, මෙම වන්දි ක්‍රමය යටතේ ගෙවා ඇති වන්දි මුදල සැලකිල්ලට ගෙන, අවසන් වන්දි මුදල තීරණය කරන ලෙස අධිකරණයට ඉල්ලීමක් කිරීමට රක්ෂණ ආයතනයට හැකියාව ඇත.
13. මෙම ක්‍රමවේදය යටතේ වන්දි ලබාදීම තුලින්, අදාල රක්ෂණ ගිවිසුම ප්‍රකාරව උද්ගතවන යම් හිමිකමකට අදාලව රක්ෂණ ආයතනයට එරෙහිව පවරන ලද නඩුකරයකදී එකී හිමිකම අභියෝගයට ලක්කිරීමට රක්ෂණ ආයතනයකට ඇති අයිතියට කිසිදු බලපෑමක් සිදු නොවේ.

## ආරවුල් නිරවුල් කිරීම

14. වින්දිතයා හෝ ඔහුගේ/ ඇයගේ නීත්‍යානුකූල උරුමකරුවන් සහ රක්ෂණ ආයතන අතර මෙම ක්‍රමවේදය යටතේ වන්දියක් සම්බන්ධව ඇතිවන ආරවුල් නිරවුල් කිරීම, මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව මගින් සිදු කරනු ලබන අතර, ඒ සඳහා අදාල නීතිමය ප්‍රතිපාදන සලසන තෙක්, ආරවුල් නිරවුල් කිරීම රක්ෂණ ඔම්බුඩ්ස්මන්වරයා විසින් සිදු කරනු ලබයි (රක්ෂණ ඔම්බුඩ්ස්මන්වරයාගේ විස්තර "ඇමුණුම 02" හි "අයදුම්කරුවන් සඳහා උපදෙස්" පත්‍රිකාවෙහි දක්වා ඇත).

## මෙම ක්‍රමවේදය බලාත්මක වන දිනය

15. **2024** මාර්තු මස **01** දින සිට සිදුවන මෝටර් වාහන අනතුරු සඳහා බලාත්මක වේ.

අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ නියමය පරිදි
Tel. : +94 11 2396181
dg@ircsl.gov.lk | www.ircsl.gov.lk

ඇමුණුම 01

## ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ලියාපදිංචි සාමාන්‍ය රක්ෂණ ආයතන (2024.02.26 දින වන විට)

| රක්ෂණ සමාගමේ නම | ප්‍රධාන කාර්යාලයේ ලිපිනය | දුරකථන අංකය |
|---|---|---|
| 1.අලියාන්ස් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් | 25-27 මහළ, වන් ගෝල්ෆේස් කුළුණ, නො. 1A, ගාලුමුවදොර, කොළඹ 02 | 0112 303 300 |
| 2.අමානා තකාෆුල් පී.එල්.සී | 660-1/1, ගාලු පාර, කොළඹ 03 | 0117 501 000 |
| 3.සෙලින්කෝ ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | සෙලින්කෝ නිවස, 3 වන මහළ, නො. 69, ජනාධිපති මාවත, කොළඹ 01 | 0114 702 702 |
| 4.කොන්ටිනෙන්ටල් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් | නො. 79, සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මාවත, කොළඹ 0්5 | 0112 800 200 |
| 5. කෝපරේටිව් ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ් | සමුපකාර රක්ෂණ නිවස, නො. 74/5, ග්‍රෑන්ඩ්පාස් පාර, කොළඹ 14 | 0112 557 300 |
| 6. ෆෙයාර්ෆස්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | ඇක්සෙස් ටවර් II (14 වන කුළුණ), 278/4, යුනියන් පෙදෙස, කොළඹ 02 | 0112 428 428 |
| 7. එච්.එන්.බී. ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | අයිස්ලන්ඩ් බිස්නස් සෙන්ටර්, නො. 30, ශ්‍රී උත්තරානන්ද මාවත, කොළඹ 03 | 0114 883 883 |
| 8. එල්.ඕ.එල්.සී. ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | නො. 481, ටී. බී. ජයා මාවත, කොළඹ 10 | 0115 008 080 |
| 9. ජාතික රක්ෂණ භාර අරමුදල | 95, චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02 | 0112 026 600 |
| 10. ඔරියන්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | නො. 133, නව බුලර්ස් පාර, කොළඹ 04 | 0117 454 454 |
| 11. පීපල්ස් ඉන්ෂුවරන්ස් පී.එල්.සී | නො. 07, හැව්ලොක් පාර, කොළඹ 05 | 0112 206 306 |
| 12. සණස ජෙනරල් ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ් | නො. 172, ඇල්විටිගල මාවත, කොළඹ 08 | 0112 200 300 |
| 13. එම්.බී.එස්.එල්. ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ් | නො. 519, ටී. බී. ජයා මාවත, කොළඹ 10 | 0112 304 500 |
| 14. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් | නො. 21, වොක්ෂෝල් වීදිය, කොළඹ 02 | 0112 357 357 |

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ වෙබ් අඩවිය මගින් (www.ircsl.gov.lk) අදාල ආයතන සම්බන්ධ වැඩිදුර තොරතුරු ලබාගත හැක.

ඇමුණුම 02

# මෝටර් වාහන අනතුරු මගින් තුන්වන පාර්ශවීය වින්දිතයන්ට සිදුවන මරණ හෝ ස්ථිර අබලතා සඳහා වන්දි ලබාගත හැකි විකල්ප ක්‍රමවේදය

## වන්දි අයදුම් පත්‍රය

සැ.යු. මෙහි සඳහන් උපදෙස් හොඳින් කියවා තේරුම් ගැනීමෙන් පසු, මෙම අයදුම් පත්‍රය සම්පූර්ණ කරන්න.

**ඡේදය 01**

**අයදුම්කරු පිළිබඳ තොරතුරු**

1.1 සම්පූර්ණ නම : ..............................................................................................

1.2 තැපැල් ලිපිනය : ..............................................................................................

..............................................................................................................................

1.3 රැකියාව : ..............................................................................................

1.4 සේවා ස්ථානයේ ලිපිනය : ..............................................................................................

..............................................................................................................................

1.5 සම්බන්ධීකරණ දුරකථන අංකය : ජංගම ............................ ස්ථාවර ....................................

1.6 උපන් දිනය : වර්ෂය ......................... මාසය ......................... දිනය .................................

1.7 ජාතික හැඳුනුම්පත් අංකය : ..............................................................................................

1.8 ස්ත්‍රී / පුරුෂ භාවය : ..............................................................................................

1.9 විවාහක / අවිවාහක බව : ..............................................................................................

1.10 මියගිය / ස්ථිර අබලතා තත්වයට පත් වූ පුද්ගලයාට ඇති ඥාති සම්බන්ධය :

..............................................................................................................................

**ඡේදය 02**

**මරණයට පත් වූ/ ස්ථිර අබලතා තත්වයට පත් වූ පුද්ගලයා පිළිබඳ තොරතුරු**

2.1. සම්පූර්ණ නම

..............................................................................................................................

..............................................................................................................................

2.2. තැපැල් ලිපිනය : ...........................................................................................................

...........................................................................................................

2.3. සම්බන්ධීකරණ දුරකථන අංක: ...........................................................................................................

2.4. උපන් දිනය : වර්ෂය .......................... මාසය ........................... දිනය ...............................

2.5. ජාතික හැඳුනුම්පත් අංකය : ...........................................................................................................

2.6. ස්ත්‍රී / පුරුෂ භාවය : ...........................................................................................................

2.7. විවාහක / අවිවාහක බව : ...........................................................................................................

2.8 කලත්‍රයාගේ සම්පූර්ණ නම: ...........................................................................................................

2.9. දරුවන් සිටී නම්, එක් එක් දරුවාගේ සම්පූර්ණ නම සහ වයස:

...........................................................................................................

...........................................................................................................

...........................................................................................................

2.10 දෙමාපියන් ජීවත්ව සිටින්නේ නම්, මව සහ පියාගේ නම්: ...........................................................

...........................................................................................................

...........................................................................................................

ඡේදය 03

අනතුර පිළිබඳ තොරතුරු

3.1. අනතුරෙහි ස්වභාවය : මරණීය.......................... බරපතල තුවාල ..........................

3.2 අනතුර සිදු වූ දිනය : වර්ෂය ........................ මාසය............................ දිනය...............................

3.3 අනතුර සිදු වූ වේලාව : ප.ව / පෙ.ව. ...................................................................................

3.4 අනතුර සිදු වූ ස්ථානය : .............................................................................................................

3.5 එම අනතුරින්, තුවාලකරු/ මරණකරු හැර වෙනත් අය තුවාල ලැබුවේනම්/ මරණයට පත්වූයේ නම්, ඔවුන්ගේ නම් (දැනුවත් නම්)

.............................................................................................................................................

.............................................................................................................................................

3.6 අනතුර සිදු වූ ස්ථානය අයත් දිස්ත්‍රික්කය: .................................................................................

3.7 අනතුර වාර්තා කළ පොලිස් ස්ථානය : ......................................................................................

3.8 අනතුර පොලිස් ස්ථානයට වාර්තා කළ දිනය : වර්ෂය ............. මාසය .............. දිනය ...................

3.9 අනතුර වාර්තා කළ වේලාව : පෙ.ව / ප.ව ..................................................................................

3.10 අනතුර පොලිසියෙහි ලියාපදිංචි කළ අංකය : ...........................................................................

3.11 අනතුර සිදුකළ වාහනයේ තොරතුරු (අනතුර වාර්තා කළ පොලිස් ස්ථානයෙන් ලබාගත හැක):

- වර්ගය ..................................................................................................

- *වාහන අංකය .........................................................................................

- *එම රථයේ රක්ෂණය කර ඇති රක්ෂණ සමාගම ....................................................

- රක්ෂණ ඔප්පු අංකය ..................................................................................

(* අනිවාර්යයෙන් සම්පූර්ණ කළ යුතුය)

3.12 අනතුර සිදු කළ වාහනයේ රියදුරුගේ තොරතුරු (අනතුර වාර්තා කළ පොලිස් ස්ථානයෙන් ලබාගත හැක):

- සම්පූර්ණ නම ..........................................................................................

- ජාතික හැඳුනුම්පත් අංකය ................................................ ........................

## ඡේදය 04

**වෛද්‍ය සාක්ෂි**

**රෝගියා රෝහලට ඇතුළත් කළ වාට්ටුව භාර වෛද්‍යවරයා විසින් සම්පූර්ණ කළ යුතුයි.**

4.1 රෝගියාගේ නම: ..........................................................................................

4.2 රෝහලේ නම : ..........................................................................................

4.3 රෝහලට ඇතුළත් කල දිනය : ..................................පිටත් වූ දිනය:..........................................

4.4 තුවාලයේ ස්වභාවය:..........................................................................................

4.5 ස්ථිර අබලතා තත්වයට පත්වී ඇති/ නැති බව: ................................................................

4.6 අදාල ස්ථිර අබලතාවය, වන්දි ක්‍රමවේදයට අදාල අබලතා ලැයිස්තුවෙහි සඳහන් කුමන තුවාලයකට අයත් වන්නේද යන වග [ඇමුණුම 2(අ) ප්‍රකාරව]

..........................................................................................................................

4.7 වෙනත් තොරතුරු..........................................................................................

වෛද්‍යවරයාගේ නම ..........................................................................................

වෛද්‍යවරයාගේ අත්සන:..........................................................................................

නිල මුද්‍රාව:

*සැ.යු. ඉහත වෛද්‍යවරයා යන්නෙන් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරයෙක් හෝ ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරයෙක් අදහස් වේ.

ඉහත සඳහන් තොරතුරු මාගේ දැනුම අනුව නිවැරදි බවට සහතික කරමි.

.................................................... ..................................

අයදුම්කරුගේ අත්සන දිනය

ග්‍රාම නිලධාරි සහ ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය

ඉහත නම සඳහන් .........................................................................යන අයදුම්කරු මා විසින් හඳුනන බවත්, වසමේ ස්ථිර පදිංචි බවත්, ඉහත ඔහු/ ඇය විසින් සම්පූර්ණ කර ඇති තොරතුරු මාගේ දැනුම අනුව සත්‍ය හා නිවැරදි බවත් සහතික කරමි.

........................................................................................ ......................................

ග්‍රාම නිලධාරිගේ අත්සන දිනය

නිල මුද්‍රාව

........................................................................................ ......................................

ප්‍රාදේශීය ලේකම්ගේ අත්සන දිනය

නිල මුද්‍රාව

## <u>අයදුම්කරුවන් සඳහා උපදෙස්</u>

1. මෝටර් වාහන අනතුරක් හේතුවෙන් තුන්වන පාර්ශවීය පුද්ගලයන්ට සිදුවන මරණ හෝ ස්ථිර අබලතා සඳහා වන්දි ලබාගත හැකි විකල්ප ක්‍රමවේදය පිළිබඳ විස්තරාත්මක තොරතුරු රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් 2024.02.26 දින නිකුත් කරන ලද 2024 අංක 03 දරණ චක්‍රලේඛයෙහි සඳහන් වේ. වැඩිදුර තොරතුරු සඳහා www.ircsl.gov.lk වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.

2. සම්පූර්ණ කළ වන්දි අයදුම්පත හා මෙහි පහත සඳහන් කර ඇති ලියකියවිලි වල ප්‍රාදේශීය ලේකම්වරයා විසින් සහතික කළ පිටපත් ද සමග (මුල් පිටපත අවශ්‍ය බව සඳහන් කර ඇති ලේඛන හැර) අදාල අනතුර සිදුකළ අවස්ථාවේදී වාහනය රක්ෂණය කර තිබූ රක්ෂණ ආයතන වෙත, මරණය හෝ ස්ථිර අබලතාවයන් සිදු වී මාස 6ක් ඇතුළත භාර දිය යුතුය. අයදුම්පත සමග ඊට අදාල පිටපත් භාරගත් බවට රක්ෂණ ආයතනයෙන් සහතික කරන ලද ලියවිල්ලක් ලබාගැනීමට අමතක නොකරන්න.

3. මෙම විකල්ප යෝජනා ක්‍රමයට අදාල අයදුම්පත් පහත පරිදි ලබාගත හැක:

   i) සියළුම පොලිස් ස්ථානයන්ගෙන්
   ii) සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින්
   iii) රක්ෂණ නියාමන කොමිෂන් සභා පරිශ්‍රය,11 වන මහල, නැගෙනහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01 හෝ www.ircsl.gov.lk වෙබ් අඩවියෙන් හෝ IRCSL Facebook පිටුවට පිවිසීමෙන්
   iv) මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභා කාර්යාලය, ප්‍රවාහන අමාත්‍යාංශය, අංක 01, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10
   v) www.roadsafety.gov.lk වෙබ් අඩවියෙන් හො "roadsafety sri lanka" Facebook පිටුවට පිවිසීමෙන්
   vi) සියලුම සාමාන්‍ය රක්ෂණ ආයතන ශාඛා වලින්

4. රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි ලියාපදිංචි සාමාන්‍ය රක්ෂණ ආයතන වල තොරතුරු www.ircsl.gov.lk වෙබ් අඩවියෙහි සඳහන් වේ.

5. අදාල රක්ෂණ ආයතන විසින් වන්දි ගෙවීම් ඉල්ලීමක් ප්‍රතික්ෂේප කළ අවස්ථාවක හෝ ගෙවන ලද වන්දිය මෙහි ඇමුණුම 2(අ) හි සඳහන් ප්‍රතිශතයන්ට අනුකූල නොවන අවස්ථාවක, ඒ සම්බන්ධයෙන් අභියාචනයක් රක්ෂණ ඔම්බුඩ්ස්මන්වරයා වෙත යොමු කළ හැකිය.

   රක්ෂණ ඔම්බුඩ්ස්මන්වරයාගේ තොරතුරු පහත සඳහන් වේ:
   ලිපිනය: රක්ෂණ ඔම්බුඩ්ස්මන්
   රක්ෂණ ඔම්බුඩ්ස්මන් කාර්යාලය
   අංක 143 A, වජිර පාර
   කොළඹ 05.
   දුරකථන + 94 11 250 5542/ + 94 11 2505041
   ඊමේල් info@insuranceombudsman.lk
   වෙබ් අඩවිය https://insuranceombudsman.lk

6. මෙම ක්‍රමවේදය පිළිබඳ වැඩිදුර තොරතුරු ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙ 0112 396 188 යන ක්ෂණික දුරකථන අංකය ඔස්සේ ලබාගත හැක.

**අයදුම් පත්‍රය සමග පහත සඳහන් ලේඛන වල ප්‍රාදේශීය ලේකම්වරයා විසින් සහතික කළ පිටපත් සහ විශේෂයෙන් සඳහන් කර ඇති ලේඛන වල මුල් පිටපත් ද සමග අදාල රක්ෂණ ආයතන වෙත ඉදිරිපත් කළ යුතුයි**

**ස්ථිර අබලතා හිමිකම් සඳහා**

(1) අයදුම්කරුගේ සහ අනතුරට පත් පුද්ගලයාගේ ජාතික හැඳුනුම්පත් වල සහතික කළ පිටපත්;

(2) පොලිස් වාර්තාව (අනතුර දැනුම්දුන් පොලිස් ස්ථානයෙන් සම්පූර්ණ කරවා ගත යුතුය (*මුල් පිටපත);

(3) ආරෝග්‍යශාලාව විසින් නිකුත් කරන ලද රෝග විනිශ්චය තුණ්ඩුව (වෛද්‍යවරයාගේ නම, අත්සන, මුද්‍රාව සහ දිනය ඇතුළත් වී තිබිය යුතුයි) සහ වෙනත් වෛද්‍ය වාර්තා වල සහතික කළ පිටපත්;

(4) අයදුම්කරුගේ සහ අනතුරට පත් පුද්ගලයාගේ උප්පැන්න සහතිකයෙහි සහතික කළ පිටපත්;

(5) අයදුම්කරු අනතුරට පත් පුද්ගලයාගේ කලත්‍රයා වන අවස්ථාවක, විවාහ සහතිකයේ සහතික කළ පිටපතක්.

**මරණ හිමිකම් සඳහා ඉහත සඳහන් ලේඛන වලට අමතරව, පහත සඳහන් ලේඛන ද ඉදිරිපත් කළ යුතුය:**

(1) මරණ සහතිකය සහ මරණ පරීක්ෂණ වාර්තා වල සහතික කළ පිටපත්;

(2) නැසීගිය අයගේ දරුවන්ගේ උප්පැන්න සහතික වල සහතික කළ පිටපත් (මරණය සිදුවන විට අවුරුදු 18ට අඩු පිරිමි දරුවන්ගේ හා අවුරුදු 20ට අඩු ගැහැණු දරුවන්ගේ උප්පැන්න සහතික පමණි);

(3) නැසීගිය අය අවිවාහක නම්, ඒ බව සනාථ කිරීමට අදාල ප්‍රාදේශීය ලේකම්වරයා විසින් අනු අත්සන තැබූ ග්‍රාම නිලධාරිවරයාගේ සහතිකය හෝ විධිමත් දිවුරුම් ප්‍රකාශයක් (* මුල් පිටපත්).

ඇමුණුම 02 (අ)

## <u>ස්ථිර පූර්ණ/ අසම්පූර්ණ අබලතාවයක් සිදුකෙරේ යැයි සලකනු ලබන තුවාල සහ ඊට අදාළ වන්දි ප්‍රතිශතයන්</u>

| අබලතාවය | මුළු වන්දි මුදලෙන් ලැබෙන වන්දි ප්‍රතිශතය |
|---|---|
| ස්ථිර වශයෙන් ම ඔත්පලවීමක් සිදුකෙරෙන, ස්ථිර වූ ද, අසාධ්‍ය වූ ද අවයව පක්ෂාඝාතය හෝ තුවාල | 100 |
| වැඩ කිරීමේ පූර්ණ අශක්නුතාව සිදුකෙරෙන, ස්ථිර, සුව කළ නොහැකි මානසික ශක්තිය නැතිවීම හෝ වැඩ කිරීමේ පූර්ණ අශක්නුතාවට හේතුවන වෙනත් යම් තුවාලයක් | 100 |
| **ඇසේ තුවාල** | |
| (i) ඇස් දෙකේ පෙනීම මුළුමනින් ම නැතිවීම | 100 |
| (ii) එක් ඇසක පෙනීම මුළුමනින් ම නැතිවීම | 80 |
| **ශ්‍රවණ ආබාධ** | |
| (i) ශ්‍රවණය මුළුමනින් ම නැතිවීම | 80 |
| (ii) එක් කණක ශ්‍රවණය මුළුමනින් ම නැතිවීම | 50 |
| **කථනය නැතිවීම** | |
| (i) කථනය මුළුමනින් ම නැතිවීම | 100 |
| **ඉන්ද්‍රියයන් නැතිවීම** | |
| (i) ගන්ධය හා රසය දැනෙන ඉන්ද්‍රියයන් මුළුමනින් ම නැතිවීම | 60 |
| (ii) ගන්ධය දැනෙන ඉන්ද්‍රියයන් මුළුමනින් ම නැතිවීම | 60 |
| (iii) රසය දැනෙන ඉන්ද්‍රියයන් මුළුමනින් ම නැතිවීම | 60 |
| **බාහුවේ තුවාල** | |
| (i) වැලමිටෙන් හෝ ඊට ඉහළින් බාහුව නැතිවීම | 85 |
| (ii) වැලමිටෙන් හෝ ඊට පහළින් බාහුව නැතිවීම | 80 |
| **අත්වල තුවාල** | |
| (i) අත් දෙක ම නැතිවීම | 100 |
| (ii) අතක් හෝ මාපට ඇඟිල්ලක් සහ ඇඟිලි හතරක් නැතිවීම | 80 |
| (iii) මාපට ඇඟිල්ලක් (ඇඟිලි පුරුක් දෙකම) නැතිවීම | 50 |
| (iv) මාපට ඇඟිල්ලක් (එක් ඇඟිලි පුරුකක්) නැතිවීම | 40 |
| (v) ඇඟිලි හතරක් නැතිවීම | 80 |

දබරැඟිල්ල නැතිවීම

| | |
|---|---|
| (i) ඇඟිලි පුරුක් තුනක් | 50 |
| (ii) ඇඟිලි පුරුක් දෙකක් | 40 |
| (iii) එක් ඇඟිලි පුරුකක් | 20 |

මැදඟිල්ල, වෙදඟිල්ල සහ සුළැඟිල්ල නැති වීම

| | |
|---|---|
| (i) ඇඟිලි පුරුක් තුනක් | 30 |
| (ii) ඇඟිලි පුරුක් දෙකක් | 20 |
| (iii) එක් ඇඟිලි පුරුකක් | 15 |

කකුල නැතිවීම

| | |
|---|---|
| (i) දණහිසින් හෝ ඉන් ඉහළට | 90 |
| (ii) දණහිසින් හෝ ඉන් පහළට | 80 |

පාදවල තුවාල

| | |
|---|---|
| (i) දෙපා නැතිවීම | 100 |
| (ii) එක් පාදයක් නැතිවීම | 90 |

පා ඇඟිලි නැතිවීම

| | |
|---|---|
| (i) මාපට ඇඟිල්ල - ඇඟිලි පුරුක් දෙකම | 40 |
| (ii) මාපට ඇඟිල්ල - එක් ඇඟිලි පුරුකක් | 20 |
| (iii) මාපට ඇඟිල්ල නොවන එකකට වැඩි ඇඟිලි ගණනක් නැතිවූවහොත්, එක් එක් ඇඟිල්ල සඳහා | 20 |

විවිධ

| | |
|---|---|
| (i) ජනනේන්ද්‍රියයන් මුළුමනින් ම නැතිවීම | 75 |
| (ii) ජනනේන්ද්‍රියක කොටසක් නැතිවීම | 60 |
| (iii) මුහුණේ බරපතල කැළැල් ඇතිවීම හෝ මුහුණ විරූපී වීම | 90 |
| (iv) මුහුණේ කැළැල් ඇතිවීම හෝ මුහුණ විරූපී වීම නොවන, බරපතල ලෙස ශරීරය විරූපී වීම - උපරිමය | 60 |
| (v) එක් දතක් නැතිවීම | 10 |
| (vi) වෛද්‍ය නිලධරයකු විසින් තක්සේරු කරනු ලැබිය යුතු ඉහත සඳහන් නොකරන ලද යම් අවයවයක් හෝ ඉන් යම් කොටසක් (උදා- නාසය, ළපැත්ත, කණ ආදිය නැතිවීම) - උපරිමය.". | 60 |

ඉහත සඳහන් වන්දි ප්‍රතිශතය 100% වන අවස්ථා ස්ථිර පූර්ණ අබලතා සිදුකරන තුවාල ලෙසද ප්‍රතිශතය 100%ට අඩුවන අවස්ථා, ස්ථිර අසම්පූර්ණ අබලතා සිදුකරන තුවාල ලෙස ද සලකනු ලැබේ.